# ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව
# හම්බන්තොට දිස්ත්‍රික්කය

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 27 දිනද , ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මැයි 10 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 අගෝස්තු 29 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව , ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

## 02. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 547,840 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 390,127 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| | | 000' | 000' | 000' |
| (i) | වරිපනම් හා බදු | 50 | 1 | - |
| (ii) | බදුකුලී | 689 | 2,765 | 21 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 552 | 521 | - |
| (iv) | වෙනත් ආදායම් | 8,949 | 7,425 | 209 |

2.2.2 වරිපනම් බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය ප්‍රකාර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු තක්සේරු කර අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

2.3 අවිධිමත් ගණුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අංක 53 – 5717 දරන කැබ් රථය අලුත්වැඩියා කිරීම සඳහා මිළ ගණන් කැඳවා සැපයුම් කරුවෙකු තෝරාගෙන රු. 716,245 ක මුදලක් 2012 වර්ෂයේදි ගෙවා තිබුණද 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 වගන්තිය ප්‍රකාර රුපියල් 500,000 හා මිලියන 02 ත් අතර භාණ්ඩ හා සේවා මිළදී ගැනීම් සඳහා අවම වශයෙන් මිළගණන් 05 ක් ලබාගත යුතු වුවත් ඉහත කාර්යය සඳහා මිළගණන් 03 ක් පමණක් ලබාගෙන තිබුණි. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(ආ) වගන්තිය සහ 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 179 වගන්තිය ප්‍රකාර සැපයුම්කරු සමඟ ගිවිසුම්ගත වී නොතිබුණි.

(ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 177 හා 178 ට පටහැනිව මිළගණන් කැඳවීමකින් තොරව අවස්ථා 02 කදී රු. 93,735 ක මිළදී ගැනීම් සිදුකර තිබුණි.

2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අනවසර ඉදිකිරීම්

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 49 වගන්තියෙහි සඳහන් විධි විධාන ප්‍රකාර ලබාගත් අනුමැතියකින් තොරව පුද්ගලයින් හය දෙනෙකු විසින් අනවසර ඉදිකිරීම් සිදුකර තිබුණද 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 52 වගන්තියෙහි සඳහන් විධිවිධාන ප්‍රකාර මෙම අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් ක්‍රියාකර නොතිබූ අතර 1987 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතට අදාලව කරනු ලැබූ සංශෝධන ඇතුළත් 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ v වන උපලේඛනයේ 6(ii) ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාර ගාස්තු අයකිරීමටද ක්‍රියාකර නොතිබුණි.

(ආ) අක්‍රිය ගිණුම්

සභාවේ ඉතිරිකිරීමේ ගිණුමක 2008 වසරේ සිට 2012 දෙසැම්බර් 31 දිනට රු. 1,136,286 ක ශේෂයක් නිරීක්ෂණය වූ අතර එම මුදල ස්ථාවර තැන්පතුවක ආයෝජනය කළේනම් ලැබිය හැකිව තිබූ පොළී ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

(ඇ) අරමුදල් ඌන උපයෝජනය

සමාලෝචිත වර්ෂය සඳහා වැය විෂයයන් 04 කට වෙන්කර තිබුණු රු. 7,950,000 ක ප්‍රතිපාදනයෙන් වර්ෂය තුල රු. 305,051 ක් වැයකර තිබුණි.

2.5 අභ්‍යන්තර විගණනය

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

03. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය